# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 ජූලි මස 04 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.30 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජනක දීපාල් වැලිවත්ත | රවීන්ද්‍ර යසස් කුමානායක |
| අනුරාධ විමලරත්න | ජයන්ත ද සිල්වා | රවී විජේසේකර |
| අනුරුද්ධ ලේකම්ගේ | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | රොජර් සෙනෙවිරත්න |
| අශෝක දයාරත්න | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර් |
| අමල් සිල්වා | තුවාන් ආමිත් මොහමඩ් අක්රම් | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | තෙබුවන පියනන්ද හිමි | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | නව්සර් ෆව්සි | ලයනල් ජයසිංහ |
| ඉත්තිකාර් ජෙමිල් මරික්කාර් | නිමල් චන්ද්‍රරත්න | ලලන්ත ගුණසේකර |
| ඊ.ඒ. නන්දන පත්මකුමාර | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලලිත් වර්ණකුමාර |
| උදාර රත්නායක | නිරෝෂන් පාදුක්ක | විජිත් ප්‍රියන්ත |
| උදේන විජේරත්න | නිරෝෂා අතුකෝරල මැතිනිය | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| උපාලි කොඩිකාර | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | සරත් පතිරණ |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | පී.ආර්.පී. අබේගුණවර්ධන | සහන් ප්‍රදීප් |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය | පී.ඩී. අබේරත්න | සිරිකමල් පිලීෂියන් ද සිල්වා |
| එස්.එම්. සකාවුල්ලා | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සුමිත් විජයමුණි ද සොයිසා |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | මහින්ද ජයසිංහ | සෙනල් වෙල්ගම |
| කිත්සිරි කහටපිටිය | මහේෂ් අල්මේදා | සේනක දමයන්ත ද සිල්වා |
| කීර්ති කාරියවසම් | මංජුල ප්‍රසන්න සම්පත් | ශිරන්ත අමරසේකර |
| කුරුසාමි කලන්කාඩි තේවර් | මංජුල බුද්ධදාස | ශ්‍රීනාත් පෙරේරා |
| කේ.ඩී. අරුණ දීපාල් | මෙරිල් පෙරේරා | හෙක්ටර් බෙත්මගේ |
| කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | මොහොමඩ් ෆයිරූස් | |
| චන්දන ජයකොඩි | මොහොමඩ් ෆායිස් | |
| ජගත් කුමාර | යූ.එල්.එන්.පී. උඩවෙල | |

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අසෝක රන්වල | ජගත් අංගගේ | රන්දීර් රොද්‍රිගෝ |
| ඇන්ටනී උපුල් රාජිත | ජගත් පී. විතාන | රොයිස් විජිත |
| ඉන්දික බණ්ඩාර | නිමල් ආර්. පීරිස් | ලලිත් එල්ලාවල |
| උපාලි ගුණරත්න | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | ලෙනාඩ් කරුණාරත්න |
| එම්.එස්.එම්. රහීම් | ප්‍රදීප් උඳුගොඩ | සලෝචන ගමගේ |
| එස්. කුහවරදන් | ප්‍රදීප් පෙරේරා | සුනිල් වටගල |
| කාමල් කුරුප්පු | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සුසාර දිනාල් |
| කොලන්නගේ වජිර පෙරේරා | මොරිස් විජේරත්න | සුසිල් කිඳෙල්පිටිය |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | රජිත හපුආරච්චිගේ | හරිස්චන්ද්‍ර කොස්තා |

## 01. සභාපතිවරයාගේ නිවේදන :

*සියලු සංශෝධන ඇතුළත් නව කාර්ය පටිපාටි රීති සංශෝධන පුස්තකය අද දින ගරු මන්ත්‍රීවරුන්ට ලැබීමට සලස්වා ඇති අතර, එම පුස්තකය පිළිබඳව සාකච්ඡාමය වැඩමුළුවක් කොළඹ 07 හි පිහිටි ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී 2017 ජූලි මස 28 වන සිකුරාදා දින පෙ.ව. 9.30 ට ආරම්භ කිරීමට කටයුතු සංවිධානය කර ඇති අතර, එකී වැඩමුළුවට සහභාගී වන මෙන් ගෞරවයෙන් යුතුව ආරාධනා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2017.06.21 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

අනතුරුව, 2017.06.21 දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව [කාරක සභාවේ සභාපති වෙනුවෙන්] කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 03. නොපැමිණ සිටීමේ අවසරය :

*"ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

***පූ.භා. 10.39 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ යසපාල කෝරළගේ මහතා ] මූලාසනාරූඪ විය.***

***පූ.භා. 10.54 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

## 04. පළාත් සභාවේ කටයුතු :

ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු සභාපතිතුමනි,*"2017.06.21 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයන්ට අනුව ක්‍රියා කිරීමට හැකිවන සේ අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ සඳහන් වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 57(1), 57(3) හා 57(4) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය යැයි සළකා ක්‍රියා කිරීමට මෙම පළාත් සභාව එකඟ වෙයි."*

## 05. බස්නාහිර පළාතේ තොරතුර තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය

*"2017 අංක 01 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් එවන ලද සියලු පණිවිඩ කෙරෙහි සැලකිල්ල ඇතිව, ප්‍රඥප්තිය නැවත සළකා බලා සංශෝධන සහිතව හෝ රහිතව එම ප්‍රඥප්තිය සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමතය සඳහා, එතුමා වෙත ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ක්‍රියා කළ යුතුය." යන යෝජනාව රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදී.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*“මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කළ යුතු යැයි ”රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.*

***පසුව, පූ.භා. 11.44 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***

***ගරු ආණ්ඩුකාරතුමා විසින් එවන ලද සංශෝධන සියල්ල සභාව පිළිගත් බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

***පූ.භා. 11.52 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ යසපාල කෝරළගේ මහතා ] මූලාසනාරූඪ විය.***

## 06. රීති අංක 107 යටතේ යෝජනාව :

කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සදහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි "* යෝජනා කරන ලදුව, ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඊට විරෝධය පළ කළ හෙයින් බෙදීම් සීනුව නාද කිරීමෙන් අනතුරුව පළාත් සභාවේ බහුතරය ඊට එකඟ නොවූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් රීති අත්හිටුවීමේ යෝජනාව ඉවත් කරන ලදී.

***න්‍යාය පත්‍රයේ අංක XI යටතේ ඇති පෞද්ගලික මන්ත්‍රී යෝජනාව මූලාසනයෙන් යළිත් සභාභිමුඛ කිරීම සඳහා එවලේ යෝජක ගරු මන්ත්‍රීවරයා [ගරු කිත්සිරි කහටපිටිය] සභා ගර්භයේ නොසිටි බැවින්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් එකී යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන ලදී.***

***ප.භා. 12.03 ට පමණ සභාවේ හට ගත් නොසන්සුන්තාවය මත ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් සභාව තාවකාලිකව කල් තබන ලදුව, ප.භා. 12.17 ට යළිත් රැස් විය.***

## 07. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

**පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ස්ථිර කරන ලදී.**

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, “කළුතර අගවත්ත මැතිවරණ කොට්ඨාශයේ (බාධා කිරීම්) අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්මලේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති තඹදොල ඇල්ල දෙස් විදෙස් සංචාරකයින් නිතර ගැවසෙන ඉතාමත් සුන්දර පරිසරයක් තිබෙන අලංකාර දිය ඇල්ලකි. මෙම ස්ථානයේ සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සලසමින් සංවර්ධනය කර බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යා යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි.”*

***ප.භා. 12.49 ට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී. පසුවද, ගණපූරණය ඇති නොවූ බැවින්,***

***ප.භා. 12.50 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, ප.භා. 01.04 ට යළිත් රැස්විය.***

## 08. 12(1) රීතිය යටතේ කල් තැබීම :

**එතෙකුදු වුවත් ගණපූරණය නොමැති වූයෙන්**, එකී යෝජනාවේ ඉදිරි කටයුතු ඊළඟ සභාවට යොමු කරමින් ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.09 ට, 2017 ජූලි මස 18 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.07.04
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/04
Minuts 2017.07.04- Hansard Section